**සීමාසහිත ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගම - 2023**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 47 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රුපියල් මිලියන 38 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 9 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාගම ලියාපදිංචි කිරීමේදී සිදු වූ නීති විරෝධී තත්ත්වයන් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධව සමාගමට එරෙහිව තෙවන පාර්ශවයක් විසින් ගොනු කරන ලද නීතිමය නඩු දෙකක් (SCFRA 09/2022 සහ SCFRA 14/2022) හේතුවෙන් දැරීමට සිදු වූ රු. මිලියන 8 ක නීතිමය ගාස්තුව ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම්, වියදම්, වත්කම්, බැරකම් සහ හිමිකම් අයිතම ඉකුත් වර්ෂය හා සසඳන විට වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ පහත සඳහන් පරිදි වේ.

| ප්‍රධාන අයිතමය | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | විචලනය<br>රු. මිලියන | වැඩිවීම/ (අඩු වීම)<br>% | අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| පරිපාලන වියදම් | 19.45 | 6.47 | 12.98 | 201 | පරිපාලන වියදම් සියයට 201 ප්‍රතිශතයකින් වැඩි වී ඇති අතර, එහි ප්‍රධාන හේතුව වන්නේ ව්‍යාපෘති කළමණාකරු බඳවා ගැනීම සහ තෙවැනි පාර්ශවයක් විසින් සමාගමට විරුද්ධව ගොනු කළ නීතිමය නඩුව සම්බන්ධයෙන් රු.මිලියන 8ක නීති ගාස්තු වැය කිරීමට සිදුවීමයි. |
| මූල්‍ය ආදායම | 3.21 | නැත | 3.21 | - | මූල්‍ය ආදායම ප්‍රධාන වශයෙන් කෙටි කාලීන තැන්පතු සඳහා ලැබෙන පොලියෙන් සමන්විත වේ. |
| මුළු වත්කම් | 351.19 | 317.82 | 33.37 | 10 | ඉඩම් එළිපෙහෙළි කිරීම් සහ භූමියේ සිදු කරන ලද මූලික කටයුතු සිදු කිරීමෙන් කෙරීගෙන යන වැඩ රු.මිලියන 45.84 කින් ඉහළ යාමෙන් මුළු වත්කම් වැඩි වී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු හිමිකම් | 115.28 | 62.03 | 53.25 | 86 | 51:49 අනුපාතය මත ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම අතර රුපියල් මිලියන 100 ක කොටස් නිකුත් කිරීම හේතුවෙන් මුළු හිමිකම් ඉහළ ගොස් ඇත. |
| ජංගම වගකීම් | 1.96 | 21.79 | (19.83) | 91 | සමාගම විසින් ලබාගත් ටැංකි 61ක කුලී ගාස්තු සඳහා ලංකා ඉන්දියන් ඔයිල් සමාගම වෙත රු.මිලියන 20.2ක් ගෙවීම හේතුවෙන් ජංගම වගකීම් සියයට 91කින් අඩු වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ කටයුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය යටතේ ක්‍රියාත්මක වන නව සමාගමක් පිහිටුවීම සඳහා සමාගම විසින් 2022 දෙසැම්බර් 16 දිනැති ආයෝජන අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණි. එම අයදුම්පත 2022 දෙසැම්බර් 20 වැනි දින ආයෝජන මණ්ඩලය (BOI) විසින් පිළිගෙන තිබුණි. BOI වෙත ගෙවා ඇති මුළු ලියාපදිංචි ගාස්තුව 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1.2 ක් විය. කෙසේ වෙතත්, 2024 ජූනි මස අවසන් වන විට ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම අත්සන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමට මේ දක්වා BOI සමාගමක් ලෙස පිහිටුවා BOI නීතියේ 17 වගන්තිය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, එය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සහ ව්‍යාපාරික අරමුණු කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීමට අහිතකර ලෙස බලපා තිබුණි. | ආයෝජන මණ්ඩලයේ නීත්‍යානුකූල ක්‍රියාකාරීත්වය සමඟ පැවැත්වූ සාකච්ඡාවලදී, ගිවිසුම අත්සන් කිරීමට පෙර සංශෝධිත සාංගමික ව්‍යවස්ථාවලිය, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය, අනුමත මැනුම් සැලැස්ම, කෙටුම්පත් ගිවිසුම සහ විගණකවරුන්ගේ අනුකූලතාව වැනි ලියකියවිලි කිහිපයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.<br>එම ලේඛන සකස් කිරීම සිදු වෙමින් පවතින අතර සමාගම හට ව්‍යාපෘතිය ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කිරීමට හැකි වන ආකාරයට මාස තුනක කාලයක් ඇතුළත අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | ආයෝජන මණ්ඩල ලියාපදිංචිය ලබා ගැනීමට සහ ව්‍යාපාරික අරමුණු කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

### 3.2 උපාය මාර්ගික ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (a) | සමාගමේ කෙටි කාලීන උපායමාර්ගික සැලැස්මට අනුව, ව්‍යාපෘතියේ පළමු අදියරේදී හෝ පළමු වසර තුනක කාලය තුළ වැව් 09ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මේ වන විට පළමු වසර දෙක ගෙවී ගොස් තිබියදීත් සමාගම නියමිත වේලාවට ඉලක්කය කරා ළඟා වී ඇති බව නිරීක්ෂණය කිරීමට නොහැකි විය. එබැවින් උපායමාර්ගික සැලැස්මට අනුව ව්‍යාපෘතිය නිම කිරීම සහ ව්‍යාපාරික කටයුතු නියමිත වේලාවට ආරම්භ කිරීම ගැටළු සහගත විය. | මේ සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය ඇමරිකානු ඩොලර් මිලියන 11.9 කි. මෙම ආයෝජනය සඳහා සමාගම සතුව අරමුදල් නොමැති බැවින්, 2024 මැයි 20 දින පුවත්පත් සහ 2024 මැයි 21 දින සිට බලපැවැත්වෙන පරිදි TPTL, CPC සහ LIOC වෙබ් අඩවිවල යෝජනා කැඳවීම් (EOI) සිදු කරන ලදී. EOI අවසන් වන දිනය 2024 ජූලි 05 වේ. EOI හි ප්‍රතිඵල මත ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට සිදුවේ. | ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |
| (b) | සමාගම පොදු පරිශීලක පහසුකම් ලබා ගැනීමේ ගිවිසුමකට එළැඹ නොතිබූ අතර ජැටි, නල මාර්ග සහ වෙනත් අනුබද්ධ සේවාවන් භාවිතා කිරීම ඇතුළුව පොදු පරිශීලක පහසුකම් සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් සමඟ සැලැස්මක් හෝ නොතිබුණි. එබැවින් ත්‍රිකුණාමලයේ වැව් ගොවිපළ ව්‍යාපෘතියේ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සාර්ථක කර ගැනීමට අදාළ පාර්ශ්ව සමඟ පොදු එකඟතාවක් නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ පළමු අදියරේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සඳහා පත් කරන ලද උපදේශකවරයා 2024 ජුනි මාසය තුළ සවිස්තරාත්මක සැලසුම ලබා දීමට එකඟ වී ඇත. ව්‍යාපෘතියේ පළමු අදියරේ සවිස්තරාත්මක සැලසුම අධ්‍යයනය කිරීමෙන් පසු CPC සහ CPSTL විසින් පොදු පරිශීලක පහසුකම් සඳහා වන ගිවිසුම අවසන් කරනු ලැබේ. | ත්‍රිකුණාමලයේ වැව් ගොවිපළ ව්‍යාපෘතියේ ව්‍යාපාරික මෙහෙයුම් සාර්ථක කර ගැනීම සඳහා සමාගමේ පාර්ශවකරුවන් සමඟ පොදු පරිශීලක පහසුකම් ගිවිසුම්වලට එළඹීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 ව්‍යාපෘතිවල ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍රිකුණාමලයේ වැව් ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය මූලික පරිසර පරීක්ෂණ (IEE) වාර්තාවක් සැකසීමේ උපදේශන ව්‍යාපෘතිය රු.මිලියන 3.3 ක් වූ කොන්ත්‍රාත්තු වටිනාකමකට 2023 සැප්තැම්බර් 13 දින ප්‍රාදේශීය උපදේශකයෙකු වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 2.5ක් වුවද මේ දක්වා IEE වාර්තාව ලබාගෙන නොතිබුණි. සමාගමේ වාර්තාවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමුච්චිත ප්‍රගතිය සියයට 10ක් පමණක් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය සඳහා IEE වාර්තාව සකස් කිරීම 2024 ජූලි වන විට මාස 07ක් ප්‍රමාද වී තිබුණි. | පහත සඳහන් හේතූන් නිසා උපදේශකවරයාගේ කාර්යයේ ප්‍රගතිය ප්‍රමාද විය.<br>• වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට ව්‍යාපෘතියේ සමහර පාර්ශ්වකරුවන් අනුමැතිය ලබා දීම ප්‍රමාද වීම.<br>• අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් චයිනා බේ කලපු ප්‍රදේශය තුළ භූගත ජල සමීක්ෂණය දීර්ඝ කාලයක් පවත්වාගෙන යාමට නොහැකි වීම. | මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගැනීමට සමාගමට හැකිවන පරිදි මූලික පරිසර පරීක්ෂණ (IEE) වාර්තාව උපදේශක මඟින් සකස් කිරීම කඩිනම් කළ යුතුය. |

- ව්‍යාපෘතියට සම්බන්ධ අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් දත්ත සැපයීම ප්‍රමාද වීම.

## 4. වගවීම සහ යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනයට ලබා දී ඇති තොරතුරු අනුව 2022 වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන අයවැයෙන් සියයට 76 ක් හෙවත් රු.මිලියන 139.81ක් භාවිතයට ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ සියයට 100ක් හෙවත් රු.මිලියන 3,965ක් භාවිත කර නොතිබුණි. සමාගමේ ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් සඳහා 2024 වර්ෂය සඳහා රු.මිලියන 4,291.16 ක ප්‍රාග්ධන අයවැයක් වෙන් කර තිබුණද, සමාගමේ අයවැයෙන් වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් මූල්‍යකරණය කිරීම සඳහා ආරක්ෂිත අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් මූලාශ්‍රයක් නොමැති බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 50ක් සමන්විත වන්නේ වැව් 10ක් අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය සඳහා වන අතර ශේෂය අනුබද්ධ පහසුකම් සංවර්ධනය සඳහා අයවැයෙන් වෙන් කර ඇත. යෝජනා කැඳවීම් වල ප්‍රතිඵල මත ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සැලසුම් කළ යුතු අතර ප්‍රතිඵල මත පදනම්ව 2024 සඳහා සංශෝධිත අයවැය අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. | ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |